**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට (සංඛ්‍යාලේඛනඥ තනතුරට) බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට (සංඛ්‍යාලේඛනඥ තනතුරට) බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා මෙම දෙපාතර්මේන්තුවේ සංඛ්‍යාලේඛන නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුවේ විධායක සේවා ගණය සඳහා පවතින බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධානයන්ට අනුව පුරප්පාඩු 42ක් පිරවීම සඳහා මෙම බඳවා ගැනීම සිදු කරන අතර, එම පුරප්පාඩු සියල්ල හෝ කිහිපයක් හෝ පිරවීමේ හෝ නොපිරවීමේ හෝ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. මෙම විභාගය 2026 ඔක්තෝබර් මස කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාතර්මේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාගර්ගත ක්‍රමයට (Online) පමණි. මාගර්ගත අයදුම්පත් භාර ගැනීම 2026.07.13 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026.08.10 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය. නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය - 2026.08.10

## 1. වැටුප් පරිමාණය

2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 දරන වැටුප් චක්‍රලේඛයේ උපලේඛන 1 ට අනුව SL 1-2025 හි රු.82,150-10X2,400-8X2,940-17X3,900-195,970/-ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

## 2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

I. රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුවෙහි විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ පවතින විධිවිධානයන්ට ද එම බඳවා ගැනීමේ පටිපාටියට කර ඇති හෝ මින්මතු කෙරෙන හෝ සංශෝධනවලට ද ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි හි විධිවිධානයන්ට ද අංක 2310/29 හා 2022.12.14 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්‍ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාතර්මේන්තුවේ විධායක සේවා ගණයේ (සංඛ්‍යාලේඛනඥ තනතුරේ) III වැනි ශ්‍රේණියට පත් කරනු ලැබේ.

II. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත ය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2017 හි සඳහන් පරිදි ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ. තව ද ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

III. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසරක පරිවාස කාලයකට යටත් වේ.

IV. විධායක සේවා ගණයේ (සංඛ්‍යාලේඛනඥ තනතුරේ) III ශ්‍රේණියට පත් වී වසර තුනක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

V. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි IV පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ දැනට පවත්නා වූ හා මින් මතු පනවනු ලබන්නා වූ නීති රීති හා ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කළ යුතුය.

VI. තෝරාගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

VII. තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේදී භාර ගැනීමට අපොහොසත් වන හා / හෝ පත් කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මඟ හරින හෝ අයදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබිය හැකිය.

VIII. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද රජය විසින් වරින් වර නිකුත්කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලට හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

## 3. **වෘත්තීය සුදුසුකම්**

(අ) සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව, ප්‍රජා විද්‍යාව, ජනගහන අධ්‍යයනය, පරිගණක විද්‍යාව, තොරතුරු තාක්ෂණය, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව හෝ සිතියම් විද්‍යාව යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයයක් ප්‍රධාන විෂයය ලෙස අන්තගර්ත වූ,

a) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් ලැබූ හෝ,

b) ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් ලැබූ හෝ,

c) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ පිළිගත්

මූලික උපාධියක් හෝ පශ්චාත් උපාධියක් සහිත, සංඛ්‍යාලේඛන නිලධාරී / සංඛ්‍යාලේඛන විමර්ශක තනතුරේ වසර 05 ක ස්ථිර, සක්‍රිය සහ සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කර ඇති

සහ

I වන කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරියකු වීම.

හෝ

(ආ) ඉහත (අ) හි සඳහන් උපාධියක් රහිත සංඛ්‍යාලේඛන නිලධාරී / සංඛ්‍යාලේඛන විමර්ශක තනතුරේ වසර 10 ක ස්ථිර, සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති

සහ

I වන කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරියකු වීම.

**සටහන:**

I. සාමාන්‍ය උපාධියක් සඳහා අදාළ විෂයයන්ට හිමි මුළු සම්භාරක අගයෙන් 1/3කට සමාන හෝ වඩා වැඩි අගයක් හිමි වන විෂයයක් එම උපාධියේ ප්‍රධාන විෂයයක් ලෙස සලකනු ලැබේ.

## 4. **කායික සුදුසුකම්**

I. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය සඳහා අන් සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

II. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික යෝග්‍යතාවෙන් යුක්ත අය විය යුතුය.

**සටහන : උපරිම වයස් සීමාව අදාළ නොවේ.**

## 5. වෙනත් සුදුසුකම්

I. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

III. තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. පූර්වාසන්න වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

## 6. බඳවා ගැනීමේ ක්‍රමය

### 6.1 ලිඛිත විභාගය හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

6.1.1 විභාග කොමසාරිස් ජනරාල් විසින් විෂයානුබද්ධ මූලධර්ම යටතේ පවත්වනු ලබන ලිඛිත විභාගයෙන් සමත් අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුගේ සිට කුසලතා අනුපිළිවෙළ හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාවක් එම කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීමේ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත කැඳවනු ලබන අතර, එහිදී බඳවා ගැනීමේ පටිපාටි හා ඊට අනුකූල ව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේ ද යන්න හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව එසේ සුදුසුකම් සපුරා ඇති සහ කායික යෝග්‍යතාවෙන් යුතු අයදුම්කරුවන් ලිඛිත විභාගයේ ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව මෙම තනතුර සඳහා බඳවා ගනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදු නොවේ.

**සැලකිය යුතු යි:-**

සම්මුඛ පරීක්ෂණයට කැඳවීම තනතුරට පත්කරනු ලැබීම සඳහා වූ සුදුසුකමක් ලෙස නොසැලකිය යුතු ය.

6.1.2 විෂය නිර්දේශය

විෂයානුබද්ධ මූලධර්ම - කාලය පැය 2 (උපරිම ලකුණු 100)
(සමත් ලකුණු ප්‍රමාණය 40%)

- මූලික සංඛ්‍යානය
  දත්ත මූලාශ්‍ර, දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය හා ඒවායේදී මතුවන ගැටලු, දත්ත ඉදිරිපත් කිරීම, විස්තරාත්මක සංඛ්‍යාති හා ඒවායේ අර්ථ නිරූපණයන්, දත්ත විග්‍රහ කිරීම හා මූලික දර්ශක අංකනයන්

6.1.3 විභාග ප්‍රතිඵල නිකුත් කිරීම
පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් ලබා ගත් මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. **"විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ."**

## 7. විභාග කොන්දේසි

I. විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි ය. සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. අපේක්ෂකයන්ට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

II. විභාග ගාස්තුව රු.1200/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාගර්ගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)
ii. අන්තජර්ාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් ( Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු මාගර්ගත බැංකු ක්‍රමය / “Flex” යෙදවුම මඟින් (Online Banking Method/ “Flex” App of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් ( Any Branch of Bank of Ceylon)

- සටහන :-

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූණර් මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාතර්මේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

III. මාගර්ගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූණර් කළ යුතුය. අයදුම්කරු විසින් මාගර්ගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාතර්මේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail ) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාගර්ගත අයදුම්පත සම්පූණර් කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව ( Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූණර් අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුවන්ගේ අත්සන සහතික කර තිබිය යුතු අතර, එය ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා හෝ සහතික කරවා ගත යුතුය. එමෙන්ම, විභාගය සඳහා පෙනී සිටි පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරන ලද ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

V. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු / ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා හෝ සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ. තවද මෙම නිවේදනයේ 3 ඡේදයේ (I) සටහනෙහි අවශ්‍යතා සපුරා නොමැති විටදී නිවේදනයේ දැක්වෙන 6.1.2 අනුඡේදයේ දක්වා ඇති සමත් ලකුණු විභාගයෙන් ලබා ගත්තේ වුව ද අපේක්ෂකයකු මෙම තනතුරට පත් කරනු ලැබීමට සුදුස්සකු නොවන්නේය.

VI. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූවර් නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූණර් කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාගර්ගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාතර්මේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාතර්මේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූණර් නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාතර්මේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූණර් කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාතර්මේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී/ සම්මුඛ පරීක්ෂණයේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

VII. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

VIII. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදුවනු ඇත.

IX. විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමකින් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

X. අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අවස්ථාවේ දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. ඉදිරිපත් කර ඇති යම් කරුණක් සාවද්‍ය බව තනතුරට තෝරා ගැනීමෙන් පසු හෙළිවුවහොත් හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කර ඇත්නම් හෝ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

XI. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි ඇතුළත් කර නොමැති සහ මෙම බඳවාගැනීමට අදාළ වෙනත් කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය, අවසාන තීරණය විය යුතුය.

08. අයදුම්පත් ආයතන/ දෙපාතර්මේන්තු ප්‍රධානියා විසින් සහතික කළ යුතුය. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතී නම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,**

ලේකම්
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
2026.

**Public Service Commission**

**Recruitment to the Executive Service Category III (Post of Statistician ) in the Department of Census and Statistics Limited Competitive Examination - 2026**

Applications are invited as per the directions of the Public Service Commission for the Limited Competitive Examination to select suitable candidates for the vacant posts in the Executive Service Category, Grade III (Statistician) in this Department.

This recruitment is made to fill 42 vacancies for the Executive Service Category of the Department of Census and Statistics in accordance with the provisions of the existing recruitment procedure, and the final decision as to whether or not to fill all or some of the vacancies lies with the Public Service Commission. The date on which the appointment will take effect will be decided by the Public Service Commission. This examination will be held in Colombo only in the month of October 2026.

The application form is available on the Departmental website www.doenets.lk of the Department of Examinations Sri Lanka under "Our Service" through "Online Applications – Recruitment Exams/E.B. Exams" and applications can be submitted online only. The acceptance of online applications will open on 13.07.2026 at 09.00 a.m. and will close on 10.08.2026 at 09.00 p.m

The candidate should bear any adverse consequences arising from delaying the submission of the application till the last date. A copy of the application should be submitted by the officers to the Heads of respective Institutions for inclusion in their personal files and a copy of the application certified by the Head of Institution and a letter of confirmation of service should be produced when called for interview.

Closing date of applications are entertained – 10.08.2026

1. **Salary Scale**

   As per Schedule I of the Salary Circular No. 10/2025 dated 25.03.2025, SL 1-2025 entitles a salary scale of Rs. 82,150-10X2,400-8X2,940-17X3,900-195,970/- (monthly).

2. **Terms of Employment**

   Selected candidates will be appointed to Grade III of the Executive Service Category (Statistician) of the Department of Census and Statistics subject to the general conditions governing appointments in the public service, and the provisions of the recruitment procedure for the Executive Service category of the Department of Census and Statistics approved by the Public Service Commission, and the amendments made or to be made to the said recruitment procedure, the provisions of the Establishments Code and the Financial Regulations and the procedural rules of the Public Service Commission published in the Extraordinary Gazette No. 2310/29 and dated 14.12.2022.

I. In terms of Public Administration Circular No. 21/2017, this appointment is pensionable. You will be subject to a policy decision taken in the future by the Government regarding the pension scheme to which you are entitled. Furthermore, you will be required to contribute to the Widows and Orphans Pension Scheme/Widowers and Orphans Pension Scheme. You will be required to pay contributions therefor as may be prescribed by the Government from time to time.

II. Officers appointed to this position are subject to a probationary period of 03 years.

III. The first efficiency bar test should be passed within Three years of being promoted to Grade III in the Executive Service Category.

IV. The provisions of Chapter IV of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka and the existing and future rules and regulations regarding the implementation of the official language policy should be complied with.

V. The selected officers are liable to the condition of serving in any part of the island.

VI. The appointment of candidates who fail to assume the duties of the post offered to them on the due date and/or refuse or evade the duties of an appointed area may be cancelled.

VII. This appointment is subject to the procedural rules of the Public Service Commission, the Institutions Code of the Democratic Socialist Republic of Sri Lanka, the Finance Regulations of the government, the orders and regulations issued by the Government from time to time and the circulars, instructions and orders issued by the Department of Census and Statistics from time to time.

## 3. Professional Qualifications

(a) A degree in Statistics, Mathematics, Economics, Community Science, Population Studies, Computer Science, Information Technology, Geography, Sociology or Cartography with at least one subject as a major

a) A special degree with a class merit recognized under Section 25 A of the Universities Act No. 16 of 1978
b) Obtained from a foreign or state university recognized by the University Grants Commission, or
c) Obtained from a university established by an Act of Parliament of Sri Lanka.

Possessing a basic degree or postgraduate degree, and having completed 05 years of continuous, active and satisfactory service in the position of Statistical Officer/Statistical Investigator

and

Being an officer who has passed the 1st Efficiency Bar .

Or

(b) Those who have completed 10 years of continuous, active and satisfactory service in the post of Statistical Officer/Statistical Investigator without a degree as mentioned in (a) above.

And

Being an officer who has passed the 1st Efficiency Bar.

**Note:**

I. A subject that has a value equal to or greater than 1/3 of the total credit value of the relevant subjects for an ordinary degree is considered a major subject of that degree.

## 4. Physical Fitness

I. Every candidate should be physically fit in every other respect for employed in any part of Sri Lanka.

II. Shall be physically fit to perform the duties of the post.

**Note : Maximum age limit is not applicable.**

**5. Other Qualifications**

I. Should be a citizen of Sri Lanka.

II. The Candidates should be of excellent character.

III. All qualifications required for recruitment to the post should be fulfilled in every respect by the closing date of accepting applications.

IV. Having completed a satisfactory period of service within the immediately preceding five (05) years.

**6. Method of recruitment**

**6.1 Written Examination and General Interview**

6.1.1 A number of candidates to be determined by the Public Service Commission, starting from the candidates who obtained the highest marks among the candidates who have passed the written examination conducted by the Commissioner General of Examinations on subject-specific principles, and in accordance with the order of merit and the number of vacancies available, will be called for the General Interview Board appointed by the Public Service Commission to scrutinize the qualifications, and after checking the qualifications and physical fitness as per the recruitment procedures and the notification published accordingly, the candidates who have fulfilled the qualifications and are physically fit will be recruited for this post in the order of merit of the marks obtained in the written examination. No marks will be given in the general interview.

N.B.:-

Being called for an interview should not be considered a qualification for appointment to the position. No marks will be awarded for the general interview. Being called for the interview should not be considered as a qualification for the offering of appointment.

6.1.2 Syllabus

Subject specific Principales – Time - 2 hours (Maximum marks 100)
(Pass mark 40%)

- Basic Statistics
  Data sources, methods of data collection and problems that arise during the collection of dat, presentation of data, descriptive statistics and their interpretations, data analysis and basic indicator numbers

6.1.3 Issuing Exam results

Once the Appointing Authority notifies the appropriate date for the release of results, the Department of Examinations of Sri Lanka will take steps to send a result sheet indicating the marks obtained in each subject/total marks obtained in the written examination to all candidates who appeared for the examination by post or to release the results through the website www.results.exams.gov.lk. "The decision of the Commissioner General of Examinations regarding the examination results shall be final."

## 7. Conditions of Examinations

I. The examination will be conducted in Sinhala, Tamil and English medium. Candidates may appear for the examination in one of the languages of their choice. Each question paper should be answered in the same language medium. Candidates are not permitted to change the language medium for examination indicated in their application later.

II. The examination fee is Rs. 1200/-. Payment should be made only under the following fee payment methods provided in the online system.

i. By any Bank Credit Card
ii. By any Bank Debit Card with the Facility of Internet Transactions
iii. By Online Banking Method/ “Flex” App of Bank of Ceylon)
iv. By any Branch of Bank of Ceylon

- Note :-

(a) Instructions on how to make payments using the above methods are posted on the website under Technical Instructions for the Examination.
(b) You will be notified via SMS or email that your payment has been received. The full amount of the examination fee should be paid and applications that have been underpaid or overpaid will be rejected. Department of Examinations in Sri Lanka is not responsible for any errors that occur when paying examination fees through the above payment methods.

(c) The amount paid for the exam will not be refunded or transferred to another exam for any reason.

III. The online examination application form should be completed in English only. Once the soft copy submitted online by the applicant is received by the Department of Examinations, the Department will notify the candidate that the soft copy has been accepted/not accepted as a valid application through a short message (SMS) or an e-mail address to the mobile phone number used to access the system. Before completing the online application, please download the Instructions for applying for the examination. Please follow the instructions carefully while filling out the application form. Any amendment made to the application form after obtaining a printed copy will not be considered a valid amendment. Incomplete applications will be rejected without notice.

IV. The signatures of the candidate on the admission card for the examination should be attested and it should be attested by the Head of the Institution or an officer authorized

by him. Also, the candidates should present their signed admission card to the Examination Hall Supervisor on the first day of appearing for the examination.

V. The issuance of an examination admit card to a candidate shall not be considered as an admission that he/she has met the qualifications to appear for the examination or for a position. Furthermore, if the requirements of paragraphs (I) of 3 of this notification are not met, a candidate will not be eligible for appointment to this post even if he obtains the passing marks specified in sub-paragraph 6.1.2 of the notification.

VI. The Commissioner General of Examinations will be issuing admission cards online to all candidates who have paid examination fee on or before the closing date of application and submitted duly filled applications with the affixed receipt of the examination fees paid, on the assumption that all the applicants possess required qualifications stated in the gazette notification. As soon as admission cards are issued, the Department of Examinations in Sri Lanka shall notify the same to the applicants via a web notification/SMS. If a candidate has not received his/her admission card, he/she shall inquire about it from the Institutional Organization Branch of Examinations of the Department of Examinations of Sri Lanka, as stated in the advertisement. When making such inquiries, it would be more effective for the applicant to send a request letter to the email address mentioned in the advertisement, stating the name of the examination applied for, the applicant's full name, National Identity Card number and address correctly. In order to confirm any information requested by the Department of Examinations during such inquiry, it would be advisory to have a photocopy of the completed application. If any amendments are required after checking the admission card, the Department of Examinations should be contacted in advance and the relevant amendments should be made as per the application. Requests for amendments made in the examination hall/interview will not be considered.

VII. The Commissioner General of Examinations has the power to postpone or cancel the examination with the approval of the Public Service Commission.

VIII. Candidates are subject to the rules and regulations imposed by the Commissioner General of Examinations regarding the conduct of the examination. If he/she violates such rules and regulations, he/she will be liable to a penalty imposed by the Commissioner General of Examinations.

IX. Candidate's Identity: Every candidate should prove his/her identity in the examination hall to the satisfaction of the Supervisor. Only one of the following forms of identity will be accepted for this purpose.

  I. National Identity Card
  II. Valid Passport
  III. Valid Sri Lankan Driving License

The candidates should expose their identity without covering their face and ears when enter into the examination hall so as to verify that electronic communication devices are not being worn. Applicants who refuse to do so will not be allowed inside the examination hall. Further, the candidates should remain uncovered of their face and ears till they leave the examination hall enabling the examination authorities to identify the applicant.

X. If a candidate is found to be ineligible, his/her candidature may be cancelled at any time before, during or after the examination. If any fact presented is revealed to be false after being selected for a position, or if any important fact is deliberately suppressed, there is a possibility of dismissal.

XI. The decision of the Public Service Commission shall be final in respect of any other matters not included in this notice calling for applications and relating to this recruitment.

08. Applications should be certified by the Head of the Institution/Department. In the event of any inconsistency between the language versions of this notification published in Sinhala, Tamil and English, the Sinhala text will be considered as correct.

As per the order of the Public Service Commission,

Secretary
Ministry of Finance, Planning and Economic Development
2026.